# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2319/20 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 1/2012(V)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2023 පෙබරවාරි මස 01 වන දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2023 අංක 1 දරන යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත්වීමේ සහ පැමිණීමේ නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන 1980 ඔක්තෝබර් මස 03 වන දින අංක 109 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1980 ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ නියෝග යටතේ ලියාපදිංචි කරන ලද ඕනෑම යාන්ත්‍රික ධීවර බෝට්ටුවකට මේ නියෝග අදාළ විය යුතු ය.

3. මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති යාන්ත්‍රික ධීවර බෝට්ටුවක් පිටත්වීම හෝ පැමිණීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක අධිකාරී බලය යටතේ මිස, තැනැත්තෙක් හෝ සංවිධානයක් විසින්, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා කිසිදු යාන්ත්‍රික ධීවර බෝට්ටුවක්, ක්‍රියාත්මක කිරීම නොකළ යුතු ය.

4. (1) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සම්බන්ධයෙන් ඒ බෝට්ටුව පිටත්වීම හෝ පැමිණීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන යාන්ත්‍රික ධීවර බෝට්ටුවක සෑම හිමිකරුවකු විසින් ම, මෙහි I වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය ලබා දෙන වෙනත් යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට යටත්ව, ඉල්ලුම්කරු විසින් මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරා ඇති බවට සෑහීමට



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පත්වන්නේ නම්, මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව පිටත්වීමේ අවසර පත්‍රයක් සහ මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව පැමිණීමේ අවසර පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගයේ (2) වන අනු නියෝගය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍ර අදාළ යාන්ත්‍රික ධීවර බෝට්ටුවේ එක් එක් පිටත්වීමේ සහ පැමිණීමේ වාරයක් සඳහා ලබා ගත යුතු ය.

(4) මේ නියෝගයේ (1) වන අනු නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රය භාරදීම සහ මේ නියෝගයේ (2) වන අනුනියෝගය යටතේ අවසර පත්‍ර නිකුත් කිරීම, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මගින් සිදු කරනු ලැබිය හැකි ය.

(5) මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති නියමන්ට අනුකූල වී නොමැති බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත් වන අයුරින් සාධනය කරනු ලබන්නේ නම් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍ර අත්හිටුවීම, අවලංගු කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකි ය.

(6) මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍ර පවරනු ලැබිය නොහැකි විය යුතු අතර, සෑම අවසර පත්‍ර දරන්නකු විසින් ම, අධ්‍යක්ෂ-ජනරාල්වරයාට දැනුම් දී ඔහුගේ ලිඛිත අනුමතය පහත දැක්වෙන කාරණා සඳහා ලබා ගත යුතු ය :-

(අ) අවසර පත්‍ර දරන්නා වෙනස්වීම;

(ආ) අදාළ බෝට්ටුවේ නියමුවා හෝ ගැනියන් පිරිසේ යම් සාමාජිකයකු වෙනස්වීම;

(ඇ) අවසර පත්‍ර දරන්නා විසින් සපයන ලද යම් තොරතුරක් වෙනස්වීම; හෝ

(ඈ) බෝට්ටුවට අදාළව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කර ඇති යම් පහසුකම්, උපකරණ හෝ කාර්ය පටිපාටි වෙනස්වීම.

(7) සෑම අවසර පත්‍ර දරන්නකු ම, නාවික පිරිසට සහ හඳුනාගැනීමේ උපාංගවලට අදාළව මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලින් බැඳී සිටිය යුතු ය.

(8) අවසර පත්‍ර දරන්නා විසින් සපයනු ලබන සේවාවේ ආරක්ෂාව, විධිමත්භාවය හෝ කාර්යක්ෂමතාව වෙනුවෙන් හෝ ජාතික ආරක්ෂාව උදෙසා 4 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් හෝ එකී අවසර පත්‍රය යටතේ බලපත්‍ර දරන්නා වෙත ප්‍රදානය කරනු ලබන යම් වරප්‍රසාදයක් සංශෝධනය කරනු ලැබීම යෝග්‍ය යැයි අධ්‍යක්ෂ-ජනරාල්වරයා සලකනු ලබන්නේ නම් එම නියමයන් හෝ වරප්‍රසාද, කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය.

5. මේ නියෝගවල කාර්යය සඳහා -

"අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මගින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ මුහුද" යන්නට, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත මගින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලවෙබ් අඩවිය" යන්නෙන්, "www.fisheriesdept.gov.lk" අදහස් වේ; සහ

"ශ්‍රී ලංකා ජල තීරය" යන්නට, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත මගින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

I වන උපලේඛනය

[4(1) නියෝගය]

**ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා පිටවීමේ සහ පැමිණීමේ අවසර පත්‍රය ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

ලියාපදිංචිය | නාවික පිරිස | ධීවර ආම්පන්න | පිරික්සුම් ලැයිස්තුව

ඉල්ලුම්පත් අංකය :

ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :

ලිපිනය :

ජාතික හැඳුනුම්පත් අංකය :

දුරකථන අංකය :

විද්‍යුත් තැපැල් ලිපිනය :

ෆැක්ස් :

ධීවර මෙහෙයුම් ප්‍රදේශය :

ශ්‍රී ලංකා ජල තීරය ☐ මහ මුහුද ☐

බෝට්ටු ලියාපදිංචි අංකය :

මෙහෙයුම් බලපත්‍ර අංකය :

ධීවර හැඳුනුම්පත් අංකය :

මෙහෙයුම් බලපත්‍රයට ඇතුළත් කර ඇති නියමුවාගේ තොරතුරු :

පිටත්වීමේ වරාය :

පිටත්වන දිනය :

පෙර ගමන් වාර විස්තර :

නියමු බලපත්‍ර අංකය : | නව නියමුවකු එක් කරන්න | ඉදිරියට

බෝට්ටු පිටත්වීම සඳහා වූ ලියාපදිංචිය

| ලියාපදිංචිය | නාවික පිරිස | ධීවර ආම්පන්න | පිරික්සුම් ලැයිස්තුව |
|---|---|---|---|

ධීවර හැඳුනුම්පත් අංකයඃ

සෙවීම | එකතු කරන්න

| ධීවර හැඳුනුම්පත් අංකයඃ | නම | ජාතික හැඳුනුම්පත් අංකයඃ | කටයුතු |
|---|---|---|---|
| | | | |

ආපසු | ඉදිරියට

බෝට්ටු පිටත්වීම සඳහා වූ ලියාපදිංචිය

| ලියාපදිංචිය | නාවික පිරිස | ධීවර ආම්පන්න | පිරික්සුම් ලැයිස්තුව |
|---|---|---|---|

පන්න වර්ගය | පන්නය | දිග/ඒකක ගණන | එකතු කරන්න

| පන්නය | පන්න වර්ගය | දිග (මීටර්) | කටයුතු |
|---|---|---|---|
| | | | |

ආපසු | ඉදිරියට

බෝට්ටු පිටත්වීම සඳහා වූ ලියාපදිංචිය

| ලියාපදිංචිය | නාවික පිරිස | ධීවර ආම්පන්න | ලොග් පොත |
|---|---|---|---|

| | |
|---|---|
| යාත්‍රා ලියාපදිංචි පොත | |
| ශ්‍රී ලංකා ජල තීරයේ මෙහෙයුම් බලපත්‍රය | |
| මහ මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍රය | |
| ගුවන් විදුලි ඇමතුම් සංඥා සංකේතය සටහන් කිරීම | |
| යාත්‍රා නිරීක්ෂණ ට්‍රාන්ස්පොන්ඩරය | |

| | |
|---|---|
| ජීවිතාරක්ෂක කබා සංඛ්‍යාව | |
| පන්න සලකුණු කිරීම | |
| තහනම් කරන ලද ධීවර ආම්පන්න | |
| ගිනි නිවීමේ උපකරණ | |
| මසුන් නිදහස් කිරීමේ උපකරණ | |
| බෝට්ටු රක්ෂණ සහතිකය | |
| බෝට්ටුවේ ඇති ප්ලාස්ටික් වතුර බෝතල් ගණන | |

යා.ලි. අංකය

දේ.මෙ.බ. අංකය (ශ්‍රී ලංකා ජල තීරය)

ජා.මෙ.බ. අංකය (මහ මුහුද)

ලොග් පොත් අංකය

ගුවන් විදුලි සංඥා සංකේතය

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය

ආපසු

භාර දෙන්න

II වන උපලේඛනය

[4(2) නියෝගය]

**ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ආදර්ශ පිටත්වීමේ අවසර පත්‍රය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
තැ.පෙ. 531, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 0094-11-2449170,2422980,2434075
ෆැක්ස් : 0094-11-2449170,2422980,2434075
විද්‍යුත් තැපැල් ලිපිනයඃ dgdfar@gmail.com

අයදුම්පත් අංකය

**ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා පිටත්වීමේ අවසර පත්‍රය**

| | | |
|---|---|---|
| 1. ධීවර මෙහෙයුම් ප්‍රදේශය | ශ්‍රී ලංකා ජල තීරය | මහ මුහුද |
| 2. බෝට්ටු ලියාපදිංචි අංකය | | |
| 3. පිටත්වීමේ වරාය | පිටත් වූ දිනය | |
| 4. බෝට්ටුවේ හිමිකරුගේ නම | | |

| | |
|---|---|
| 5. මහ මුහුදේ මෙහෙයුම් බලපත්‍ර අංකය | |
| 6. ශ්‍රී ලංකා ජල තීරයේ මෙහෙයුම් බලපත්‍ර අංකය | |
| 7. නියමුවාගේ නම | |
| නියමු බලපත්‍ර අංකය | |
| ජාතික හැඳුනුම්පත් අංකය | |

| | |
|---|---|
| 8. නාවික පිරිසේ විස්තර | |
| නම | ජාතික හැඳුනුම්පත් අංකය |
| i. | |
| ii. | |
| iii. | |
| iv. | |

9. ධීවර ආම්පන්න පිළිබඳ තොරතුරු

| පන්නය | පන්න වර්ගය | පරිමාණය |
|---|---|---|
| | | |
| | | |

10. ධීවර කටයුතු සඳහා පිටත්වීමේ දී පරීක්ෂා කළ යුතු කරුණු

| | |
|---|---|
| යාත්‍රා ලියාලදිංචි කිරීමේ පොත | |
| ශ්‍රී ලංකා ජල තීරයේ මෙහෙයුම් බලපත්‍රය | |
| මහ මුහුදේ මෙහෙයුම් බලපත්‍රය | |
| ධීවර ලොග් පොත | |
| ගුවන් විදුලි සංඥා සංකේතය සටහන් කිරීම | |
| යාත්‍රා නිරීක්ෂණ ට්‍රාන්ස්පොන්ඩරය | |
| ජීවිතාරක්ෂක කබා සංඛ්‍යාව | |
| පන්න ලකුණු කිරීම | |
| තහනම් කරන ලද ධීවර ආම්පන්න | |
| ගිනි නිවීමේ උපකරණ | |
| මසුන් නිදහස් කිරීමේ උපකරණ | |
| බෝට්ටු රක්ෂණ සහතිකය | |
| බෝට්ටුවේ ඇති ප්ලාස්ටික් වතුර බෝතල් ගණන | |

11. සටහන්

වරාය නිලධරයාගේ අත්සන

වරාය කළමනාකරුගේ අත්සන

වෙරළාරක්ෂක නිලධරයාගේ අත්සන

ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අත්සන

නිකුත් කිරීමේ දිනය

III වන උපලේඛනය

[4(2) නියෝගය]

**ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ආදර්ශ පැමිණීමේ අවසර පත්‍රය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
තැ.පෙ. 531, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 0094-11-2449170,2422980,2434075
ෆැක්ස් ඃ 0094-11-2449170,2422980,2434075
විද්‍යුත් තැපැල් ලිපිනයඃ dgdfar@gmail.com

**ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා පැමිණීමේ අවසර පත්‍රය**

1. බෝට්ටුවේ ලියාපදිංචි අංකය ඃ
2. බෝට්ටුවේ හිමිකරුගේ නම ඃ
3. පිටත්වීම ඉල්ලුම්කරන ලද තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය ඃ
4. පිටත්වීමේ දිනය ඃ
5. පිටත් වූ වරාය ඃ
6. පැමිණෙන දිනය ඃ
7. පැමිණෙන වරාය ඃ
8. පැමිණීම සහතික කරන ලදි ඃ
   (පරිගණක පද්ධතියට ඇතුළු වීමෙන් විස්තර ලබා ගත හැක)
9. සටහන් ඃ

| | |
|---|---|
| ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අත්සන | නිකුත් කිරීමේ දිනය |

**IV වන උපලේඛනය**

[4(7) නියෝගය]

**නාවික පිරිස සහ නියමයන් සහ කොන්දේසි**

1. මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති පිටත්වීමේ අවසර පත්‍රයේ 8 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති සියලු නාවික පිරිසට, අදාළ යාන්ත්‍රික ධීවර බෝට්ටුවේ එක් එක් පිටත්වීම වාරයකට පෙර ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරන ලද වලංගු ජීවිත රක්ෂණාවරණයක් ඇති බව සෑම බලපත්‍ර දරන්නකු විසින් ම තහවුරු කළ යුතු ය.

2. එවැනි සෑම නාවික සාමාජිකයකු ම අදාළ යාන්ත්‍රික ධීවර බෝට්ටුව පිටත් වන සහ පැමිණෙන වේලාවන්හි දී බෝට්ටුවේ සිටිය යුතු ය.

3. යම් නාවික සාමාජිකයකු ට වෛද්‍ය හෝ වෙනත් ආධාර අවශ්‍ය වන අවස්ථාවක දී හෝ ඒ හා සමාන හදිසි අවස්ථාවක දී මිස අදාළ යාත්ත්‍රික ධීවර බෝට්ටුව පිටත් වීමෙන් පසුව නාවික පිරිස දේශීය හෝ විදේශීය ධීවර බෝට්ටුවකින් හුවමාරු කිරීම හෝ දේශීය හෝ විදේශීය බෝට්ටුවකට මාරු කිරීම සිදු කරනු නොලැබිය යුතු අතර එවැනි අවශ්‍ය අවස්ථාවක දී ඒක පාර්ශ්වික තරංග (SSB) රේඩියෝ සන්නිවේදනයක් හරහා ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත පූර්ව දැනුම්දීමකින් නාවික සාමාජිකයා වෙනත් ධීවර බෝට්ටුවකට මාරු කරනු ලැබිය හැකි ය.

**හඳුනාගැනීමේ උපාංග භාවිතය පිළිබඳ නියමයන් සහ කොන්දේසි**

1. (1) ධීවර ආම්පන්න ලකුණු කිරීමට බෝයාවන් සඳහා සමුද්‍රීය ජංගම සේවා හඳුනාගැනීමේ අංකය (MMSI) වින්‍යාස කරන ලද ස්වයංක්‍රීය හඳුනගැනීමේ පද්ධතියක් (AIS) අදාළ යාන්ත්‍රික ධීවර බෝට්ටුව වෙත සම්පාදනය කරනු ලැබ ඇති බව සහ එම උපාංග පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද ඕනෑම නියෝගයකට අනුකූලව සහ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති විධානයන්ට අනුකූලව වින්‍යාස කර ඇති බව සෑම බලපත්‍ර දරන්නකු විසින් ම තහවුරු කළ යුතු ය.

(2) ඉහත කී කාර්ය පටිපාටිය පිළිපදිනු ලබන්නේ නම් මිස, බලපත්‍ර දරන්නාට ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ ධීවර කටයුතු සඳහා අදාළ යාන්ත්‍රික ධීවර බෝට්ටුව පිටත් කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

EOG 02 - 0138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.